# 4. අප නබිතුමාණෝ

අපගේ නබි මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ මක්කාවේ උපත ලැබූහ. එතුමාණන් උපන් වසර ආමුල් ෆීල් හෙවත් ඇත් වසර නමින් හඳුන්වයි. එතුමාණන් ඉපදීමට පෙර එතුමාගේ පියාණෝ අබ්දුල්ලා වෆාත් වූහ. එතුමාණන් ඉපදී වසර හයකින් මෑණියන් වූ ආමිනා ද වෆාත් වූවා ය. හලීමා මාතාව ළදරු නබි තුමාණන්ට කිරි දී පෝෂණය කළා ය. හලීමා මාතාව නබි තුමාගේ කිරි මව වූවා ය. කුඩා වියේ දී ම නබි තුමාණෝ අනාථ වූහ. වයස අවුරුදු අට දක්වා එතුමාණන්ගේ සීයා වන අබ්දුල් මුත්තලිබ් විසින් එතුමා හද වඩා ගන්නා ලදි. සීයාගේ මරණයෙන් පසු නබි තුමාණන් හදා වඩා ගන්නා ලද්දේ එතුමාණන්ගේ මහප්පා වන අබූතාලිබ් විසිනි.

## පැවරුම්

**පාඩම හොඳින් කියවා, සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ පියා .................. ය. මව ................ ය. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා ඉපදුණේ ...................... එතුමා උපන් වර්ෂය .................... යනුවෙන් අරාබි භාෂාවෙන් හඳුන්වයි.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා ඉපදී වසර ............. කින් මව, ආමිනා වෆාත් වූවා ය. කුඩා වියේ දී ........... කිරි දී පෝෂණය කළා ය.